DCA/06/11/02/01 2017.09.

දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක :-14/2017

දිස්ත්‍රික්ක ලේකම් මගින්,
ප්‍රාදේශීය ලේකම් මගින්,
දිස්ත්‍රික් සංස්කෘතික නිලධාරි/සංස්කෘතික නිලධාරී/සංස්කෘතික සංවර්ධන සහකාර,
සංවර්ධන නිලධාරි,
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය/ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

**කලාකරුවන් සඳහා වූ දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය**

ශ්‍රී ලාංකේය කලා ක්ෂේත්‍රයෙහි පෝෂණය උදෙසා සිය දායකත්වය ලබාදුන් කලාකරුවන් සඳහා සමාජ සුරක්ෂිතතාවයක් ලබාදීමේ අරමුණින් 2016 අයවැය යෝජනා ප්‍රකාරව සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සහ සමාජ ආරක්ෂණ මණ්ඩලය එක්ව කලාකරුවන් සඳහා වූ දායකත්ව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයක් ආරම්භ කර ඇත.මෙම විශ්‍රාම වැටුප් ක්‍රමය කලාකරුවන්ගේ දායකත්වය මත ක්‍රියාත්මක වන්නකි.රජය විසින් එකවර ගෙවනු ලබන දීමනාවකටද කලාකරු හිමිකම් කියනු ලබයි. මෙම යෝජනා ක්‍රමයට අදාලව අයදුම්කරුවන් බඳවා ගැනීමේ පටිපාටිය හා ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය 2017.09.01.දින සිට ක්‍රියාත්මක වන ලෙස පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

01. අවශ්‍ය සුදුසුකම්

1.1 ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුයි.

1.2 වයස අවුරුදු 23 ත් 55 ත් අතර කලාකරුවන්ට මේ සඳහා දායක විය හැකි අතර වයස අවුරුදු 60 ඉක්ම වූ පසු මෙහි ප්‍රතිලාභීන් බවට පත් වේ.

1.3 කලාකරුවෙකු බවට සංස්කෘතික නිලධාරී විසින් සහිතක කර තිබීම. (නාට්‍යකරණය හා රංග කලා ශිල්පය, මූර්තිකරණය, ගායන ශිල්පය, චිත්‍ර ශිල්පය, කැටයම් කලාව, බෙර වාදනය, සංගීත භාණ්ඩ වාදනය, විවිධ නර්තන කලා, සිනමා කලා, සාම්ප්‍රදායික ශාන්ති කර්ම, විවිධ සැරසිලි කලා, තොරණ කලාව, ග්‍රන්ථකරණය හා ලේඛන කලාව, සාහිත්‍ය හා රසවින්දන කලා ශිල්ප, බෙර සහ සංගීත භාණ්ඩ නිර්මාණය සහ නිෂ්පාදනය, නර්තන මෙවලම් නිෂ්පාදන ශිල්පය, රුක් කලාශිල්පය, පිටපත් රචනය හා ගීත රචනය, තනු නිර්මාණ කලාව, සංගීත නිර්මාණය, කැමරාකරණය, පසුතල නිර්මාණ කලාව, වේෂ නිරූපන ශිල්පය,හඬ කැවීමේ ශිල්පය, රූපවාහිනී කලා ශිල්පය, වීදි නාට්‍ය ශිල්පය, නක්ෂත්‍ර සහ ජ්‍යොතිෂය ශිල්පය,රූකඩ කලාව,අභිරූපණ කලාව,මැජික් ශිල්පය හා මෙම ක්ෂේත්‍රය ආශ්‍රිතව කලා කටයුතුවල නිරත වන සහ ඒ වෙනුවෙන් සක්‍රීය ලෙස දායක වෙමින් සමාජ මෙහෙවරක යෙදෙන තැනැත්තන් ‘කලාකරුවා ‘ යන අර්ථයෙහි පිහිටුවනු ලැබේ.)

1.4 කලාකරුවෙකු ලෙස පූර්වාසන්න වසර 5 ක් තුළ කලාවට සක්‍රීය දායකත්වයක් සිදුකර තිබීම.

- ✓ මේ බව තහවුරු කර ගැනීම සඳහා ඔහු විසින් සිදුකළ කලා නිර්මාණයන් පිළිබඳ තොරතුරු ලබා ඇති ඇගයීම් වේ නම් ඒ පිළිබඳ තොරතුරු ලබාගත යුතුය.

1.5 රජය අංශයේ හෝ පෞද්ගලික අංශයේ විශ්‍රාම වැටුපක් නොලබන කලාකරුවෙකු වීම.

- ✓ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල හා සේවක අර්ථ සාධක අරමුදලලේ සාමාජිකත්වය දරන්නන්ට මෙම විශ්‍රාම වැටුප සඳහා අයදුම් කළ නොහැක.

02.රජයෙන් ලබාදෙන ප්‍රතිලාභ

රජය විසින් සෑම දායකයෙකු සඳහාම රු.50,000 ක මුදලක් ඔහු විශ්‍රාම වැටුප් ක්‍රමයට බැඳෙන දිනයේදි වෙන්කරනු ලැබේ.අදාල රු.50,000 ක මුදල කලාකරුවාට වයස අවුරුදු 60 සම්පූර්ණ වීමේදී පොලී මුදලක් සහිතව හිමිවේ.( පොලී මුදල යන්නට අයත් වන්නේ කලාකරු විශ්‍රාම වැටුපට බැඳුණු වර්ෂයේ සිට එළඹෙන පළමු වර්ෂය ආරම්භයේ සිට කලාකරුට වයස අවුරුදු 60 සම්පූර්ණ වන වර්ෂය ආරම්භය දක්වා රු.50,000ක මුදල වැල් පොලී ක්‍රමයට ආයෝජනය කිරීමත් ලබාගැනීමට අපේක්ෂා කරන පොලි මුදලයි.) ( ඇමුණුම 01 හි මේ සම්බන්ධ අදාල සටහන් දක්වා ඇත)

03.ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

3.1 දායකයාට වයස අවුරුදු 60 සිට ජීවිතාන්තය දක්වා මාසික විශ්‍රාම වැටුපක් ලබා දෙනු ලැබේ.

3.2. දායකයා විශ්‍රාමිකයකු ලෙස අවුරුදු 80 සම්පූර්ණ වීමට පෙර මියගිය හොත්,

- ➢ කලත්‍රයා ජීවත්ව සිටී නම් ඔහුට හෝ ඇයට විශ්‍රාමිකයාට වයස අවුරුදු 80 වන තෙක් විශ්‍රාම වැටුප ලබා දෙනු ලැබේ.
- ➢ කලත්‍රයා නොමැති නම් දායකයාගෙන් පසු ඔහුගේ වයස අවුරුදු 18 ට වැඩි උරුමකරුවන්ට දායකයාගේ නමින් තැන්පත්ව ඇති ශුද්ධ දායක මුදල හා පොලිය ආපසු ලබා දෙනු ලැබේ.

3.3. ස්ථිර අර්ධ අබලතාවයට පත්වූ විට වයස අනුව ගැලපූ පාරිතෝෂිකයක් සහ නියමිත පරිදි වාරික ගෙවනු ලැබේ.

3.4. ස්ථිර පූර්ණ අබලතාවයකට පත්වූ විට වයස අනුව ගැලපූ පාරිතෝෂිකය ශුද්ධ දායක මුදල සමඟ හෝ පූර්ණ අබලතාවයට පත්වූ දින සිට ජීවිතාන්තය දක්වා ගෙවනු ලබන මාසික විශ්‍රාම වැටුපක් ලබා දෙනු ලැබේ.

3.5.විශ්‍රාම ලැබීමට පෙර සාමාජිකයා මියගිය හොත් ඔවුන්ගේ යැපෙන්නන්ට එකවර ගෙවනු ලබන පාරිතෝෂිකයක් ලබාදෙනු ලැබේ.(ඇමුණුම 02)

3.6.වාරිකය ගෙවීම අතපසු වූ විට

3.6.1. අනුයාත වාරික 10 ක් දක්වා සහන ලබා දේ. (ඒ අතර කාලය තුල ප්‍රමාද ගාස්තුවක් සහිතව නැවත දායක විය හැකිය.)

3.6.2.වාරික 10 කට වඩා ගෙවීම අතපසු වූ විට අදාල ප්‍රතිලාභියා යෝජනා ක්‍රමයෙන් ඉවත් කෙරේ.

3.6.3.අදාල විශ්‍රාම වැටුප වෙනුවෙන් ගෙවිය යුතු මුළු මුදලින් 25% ක් ගෙවා ඇති විට දායකයෙකුට තවදුරටත් වාරික ගෙවිය නොහැකි නම් ඒ බව දන්වා සිය ගෙවූ වාරික නැවත ලබාගත හැකිය.

3.6.4.ගෙවිය යුතු මුළු මුදලින් 75% ක් ගෙවා ඇති විට ගෙවා ඇති මුළු මුදලට සමානුපාතික වූ විශ්‍රාම වැටුපක් වයස අවුරුදු 60 න් පසු ලබාගත හැකිය.

3.7. ඉහත 3.6.2 හෝ 3.6.3 යටතේ දායකයෙකුට වාරික ගෙවීම අතපසු වූ අවස්ථාවලදී රජය විසින් දරණ ලද රු.50,000.00 ක දායකත්ව මුදල එම ප්‍රතිලාභියාට අහිමි වේ. අදාළ මුදල නැවත රජය වෙත අයවිය යුතු අතර වෙනත් සුදුසුකම්ලත් ප්‍රතිලාභියෙකුට ප්‍රතිලාභ සැලසීමට අදාළ මුදල යොදාගනු ලැබේ.

3.8. තවද ඉහත 3.6.2 හා 3.6.3 යටතේ වරක් යෝජනා ක්‍රමයෙන් ඉවත් කරන ලද ප්‍රතිලාභියෙකු නැවත යෝජනා ක්‍රමයට බඳවා ගැනීම සිදු නොකෙරේ.

3.9. මෙහි ඇමුණුම 03 යටතේ දක්වා ඇති අයදුම්පත මේ සඳහා යොදාගත යුතු ය.

04.බඳවා ගැනිමේ ක්‍රමවේදය

4.1 කලාකරුවෙකු බඳවාගැනීම සිදු කිරීමේදී අංක 01 හි සඳහන් සුදුසකම් සපුරා ඇති කලාකරුවෙකු වෙතින් මෙහි ඇමුණුම් 03 හි සඳහන් අයදුම්පත පුරවා සංස්කෘතික විෂය භාර නිලධාරීගේ නිර්දේශය සහිතව අයදුම්පතෙහි පිටපතක් සංස්කෘතික විෂය භාර නිළධාරී වෙත තබාගෙන අදාල කලාකරු, අයදුම්පත සමඟ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි පිහිටුවා ඇති සමාජ ආරක්ෂණ මණ්ඩල දිස්ත්‍රික් කාර්යාලය වෙත යොමුකළ යුතුය.

4.2 විශ්‍රාම වැටුප් ක්‍රමයට බඳවා ගැනීම උදෙසා වූ පළමු වාරිකය අදාළ දිස්ත්‍රික් කාර්යාලයට ගෙවූ පසු ප්‍රතිලාභියාට අදාළ හිමිකම් ඔප්පුව සමාජ ආරක්ෂණ මණ්ඩලය වෙතින් ලියාපදිංචි තැපැල මඟින් එවීමට කටයුතු කරනු ලැබේ. ඉන්පසු ප්‍රතිලාභියාට තමාට ආසන්නම ලංකා බැංකුවට , මහජන බැංකුවට හෝ තැපැල් කාර්යාලයට මෙම ගෙවීම් කටයුතු සිදු කරගෙන යා හැකිය.පළමු වර මුදල් ගෙවන දිනය දායකත්වය ලබාගන්නා දිනය වන අතර එදිනට පසුව යෙදෙන උපන් දිනට කලාකරුවාගේ වයස ගණනය කළ යුතුය.

උදා:- දායක වන දිනය - 2017 මාර්තු 02 දින නම් පහත පරිදි වයස ගණනය කළ යුතුය.
උපන් දිනය - 2017.01.01 සිට 2017.03.02 අතර නම් 2018 වර්ෂය ද
2017.03.03 සිට 2017.12.31 අතර නම් 2017 වර්ෂය ද
ලෙස ගෙන වයස ගණනය කළ යුතු වේ.

4.3 ඔබට අවශ්‍ය වැඩිදුර දැනුවත්වීම් උදෙසා ඇමුණුම 04 හි සඳහන් දුරකථන නාමාවලියෙහි සඳහන් සමාජ ආරක්ෂණ මණ්ඩලයෙහි දිස්ත්‍රික් නිලධාරීන් හා සම්බන්ධ වීමේ හැකියාව පවතී.

4.4 ඉල්ලුම් පත්‍රයෙහි දෙවන පිටුවේ කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා පමණි කොටසෙහි සියළුම කොටස් පිරවිය යුතු අතර ,
අංක 03 වාරික ගෙවිය යුතු ආකාරය හා ක්‍රමය
අංක 05 ගුණාකාර සංඛ්‍යාව යන සටහන් නිවැරදිව පිරවිය යුතුය.

4.5 ඇමුණුම 03 හි සඳහන් අයදුම්පතෙහි පසුපිටෙහි අදාළ ස්ථානයෙහි ඔබගේ නම හා ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතුය. ඔබ විසින් බඳවාගන්නා සෑම කලාකරුවෙකු උදෙසාම ඔහු විසින් ගෙවනු ලැබූ මුල් වාරිකයෙන් 15% ක දිරි දීමනාවක් ඔබවෙත ලබාදීමට කටයුතු යොදා ඇති බවද එය ඔබ නමින් වූ බැංකු ගිණුමක් හරහා ලබාදීමට කටයුතු කරන බවද දන්වා සිටිමි. (මෙම කටයුතු සමාජ ආරක්ෂණ මණ්ඩල පනතෙහි අදාළ නියමයන්ට යටත්ව සිදුවන බව සැලකිය යුතුය.)

4.6 මේ සමඟ දක්වා ඇති ඇමුණුම් 05,06 අනුව අදාළ කලාකරුවන්ට ගෙවීම් කළ හැකි ආකාරය පිළිබඳව ඔවුන් දැනුවත් කර මෙම යෝජනා ක්‍රමය සඳහා ඇතුලත් කරගත හැකි බවද දන්වා සිටිමි.

සැ.යු:-2016/11/31 දින සිට 2017/09/01 දින දක්වා බඳවා ගන්නා ලද කලාකරුවන් ද මෙහි අංක 02 යටතේ දක්වා ඇති ප්‍රතිලාභ සඳහා සුදුසුකම් ලබයි.

5 ඉහත ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් මෙම යෝජනා ක්‍රමය වඩා ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා ඔබ විසින් දක්වනු ලබන සහයෝගය අගය කොට සලකමි.

අනූෂා ගෝකුල ප්‍රනාන්දු
සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ